11

# කථකලි නෘත්‍ය නාටකයේ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ

*අශානි මධුමේබලා සෝලංග ආරච්චි* [1]

HU/2011/0589

දකුණු ඉන්දියාවේ කේරලය හා තාන්ජෝරය කේන්ද්‍රකර ගනිමින් ප්‍රභවය ලැබූ කථකලි නෘත්‍ය නාටක සම්ප්‍රදාය ක්‍රි.ව. 17 සියවස පමණ වන විට හින්දු පුරාණ කතා සාහිත්‍යයෙන් සහ වීර කාව්‍ය සාහිත්‍යයෙන් ලද ආභාසය පසුබිම් කර ගනිමින් බිහිවූ බව පැහැදිලි ය. කථකලි යනු, සාහිත්‍ය, සිතුවම් කලාව, රංගනය, නර්තනය මෙන් ම සංගීතය ආදී බහුවිධ කලා මාධ්‍යයන්ගේ එකතුවන් ලෙස සැලකිය හැක. මෙහිදී කථකලිය තුළ අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ එහි ඇති සුවිශේෂී අංගයක් ලෙස ඉස්මතු කළ හැක. මෙම ඉදිරිපත් කිරීම් තුළින් ඒ පිළිබඳ වැඩිදුරටත් සාකච්ජා කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ජයසේන කෝට්ටේගොඩ මහතාගේ 2001 වර්ෂයේ දී ප්‍රකාශයට පත්වූ භාරතීය සම්භාව්‍ය නර්තන කලාව ග්‍රන්ථය මෙන් ම මුදියන්සේ දිසානායක මහතාගේ කථකලි නර්තන කලාව ග්‍රන්ථය ද කථකලි පිළිබඳ තොරතුරු ලබා ගැනීමට යොදාගත් අතර PhilpZarrilli මහතාගේ Kathakali dance-drama ග්‍රන්ථය ද David Bouand මහතාගේ Guide to Kathakali ග්‍රන්ථය ද වැඩිදුරටත් උපයෝගී කර ගන්නා ලදී. නාට්‍ය පිළිබඳ මෙන් ම නාට්‍ය ලක්ෂණ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ඩබ්ලිව්. ජයවර්ධන මහතාගේ නාට්‍ය හා රංගකලාව ග්‍රන්ථය උපයෝගී කර ගන්නා ලදී. මෙමගින් කථකලි නෘත්‍ය නාටකය පිළිබඳවත් එහි අන්තර්ගතය පිළිබඳ ව ත් අවබෝධයක් ලබා ගැනීමට හැකිවූ අතර නාට්‍ය හා නාට්‍යමය ලක්ෂණ පිළිබඳ ද අධ්‍යයනයට අවස්ථාව සැලසිණි.

ප්‍රමුඛ පදඃ කථකලි නෘත්‍ය නාටක, නාට්‍යමය ලක්ෂණ, රංග කලාව

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) තෙවන වසර*